ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணிஆணையாளர்நாயகத்தின்திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMEN
'මිහිකත මැදුර' ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6,රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
1200/6, ரஜமல்வத்தவீதி,பத்தரமுல்ல.
1200/6, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனதுஇல / MY NO : 4/1/ප්‍රතිපත්ති (III)
ඔබේ අංකය / உமதுஇல / YOUR NO :
දිනය / திகதி / DATE : 2018. 03. 28

වෙබ් අඩවිය - இணையம் - Web Address - www.lancommdept.gov.lk
ඊමේල් - மின்னஞ்சல் - E-mail - landcom@landcommdept.gov.lk

චක්‍රලේඛ අංකය : 2018/02

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් / සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්),

**<u>1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික පදනමින් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදෙන ඉඩම් සඳහා බදු සහන ලබාදීම.</u>**

1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත බැහැර කරන ඉඩම් සඳහා අය කරන බදු ප්‍රමාණ වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සංශෝධන කිරීම සඳහා ඉඩම් අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමප/17/0390/738/005 දරණ 2017.03.22 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව සහන ලබාදී ඇත. එබැවින් කෘෂි ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය සලකා බලා එම ක්ෂේත්‍රය සඳහා ද එම සහන අදාල කර ගැනීම සඳහා ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමප/18/0293/738/002 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව පහත යෝජනා ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2018.02.28 දින ලැබී ඇත.

02. ඒ අනුව 1947 අංක 8 දරණ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික පදනමින් දීර්ඝ කාලීන බදු පදනම මත බැහැර කරන ඉඩම් සඳහා පහත දැක්වෙන බදු සහන අදාල කරගත යුතුය. මෙම බදු සහන ලබාදීම 1947 අංක 8 දරණ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික කටයුතු සඳහා බදු පදනම මත බැහැර කර ඇති හා ඉදිරියේදී බැහැර කරනු ලබන ඉඩම් සඳහා අදාල කළයුතු වන අතර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදුන් 2018.02.28 දින සිට ක්‍රියාත්මක කළ යුතුවේ.

1. 1947 අංක 8 දරණ රජයේ ඉඩම් ආඥා පනත යටතේ යම් බදු දීම සිදු කිරීමේ දී වාර්ෂික බදු මුදලෙන් තුන් ගුණයක් ලෙස එක වරක් පමණක් අය කරන , වාර මුදල අත්හිටුවීම.

2. යම් බදුකරයක් මත අය කරන බදු මුදල 50% කින් සෑම වසර පහකට වරක් වන පරිදි වනසේ වර්තමානයේ සිදු කරනු ලබන බදු ප්‍රතිශෝධන වෙනුවට ප්‍රතිශෝධන සිදු කරන වර්ෂයට පූර්ව වර්ෂයේ පැවැති බදු මුදලට 20% ක ප්‍රමාණයක් එකතු කර ප්‍රතිශෝධනය කිරීම.


| ඉ.කො.ජ. කාර්යාලය (පොදු) கா.ஆ.நா.பொது General | පාලන நிர்வாகம் Administration | ගිණුම් கணக்கு Accounts | ඉඩම් I காணி I Land I | ඉඩම් II காணி II Land II | ඉඩම් III காணி III Land III |
|---|---|---|---|---|---|
| දුරකතන - 0112797400 | දුරකතන - 0112797479 | දුරකතන - 0112875833 | දුරකතන - 0112874025 | දුරකතන - 0112875834 | දුරකතන - 0112797482 |
| ෆැක්ස්- 0112864051 | ෆැක්ස්- 0112873033 | ෆැක්ස්- 0112864462 | ෆැක්ස්- 0112883812 | ෆැක්ස්- 0112873110 | ෆැක්ස්- 0112883635 |

3. වසර තිහක මුල් බදු කාලය අවසන් වීමෙන් පසු නැවත බදු කාලය දීර්ඝ කිරීමේදී සියළු ප්‍රතිශෝධන සහිතව මුල් වසර තිහ අවසානයේ දී අය කළ බදු මුදලට 20% ක ප්‍රමාණයක් එකතු කොට ලබා ගන්නා අගය දෙවන බදු කාලයේ ආරම්භක බදු මුදල ගණනය කිරීම.

4. යම් ඉඩමක් දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබා දීමට ගරු ඇමතිතුමා අනුමත කල දිනයේ සිට ඉඩම් තක්සේරු වටිනාකම රු.5,000,000.00 ට වඩා අඩුවන අවස්ථා වලදී අය කරනු ලබන වාර්ෂික බදු අනුපාතය 4% සිට 2% දක්වා අඩු කිරීම.

03. උක්ත සඳහන් සහන යටතේ වන බදු ප්‍රතිශෝධනය කිරීම මේ වන විටත් දීර්ඝ කාලීන බදුකර නිකුත් කර පවත්වා ගෙන යන අවස්ථාවන්හි දී අදාල කල යුත්තේ මෙම කැබිනට් අනුමැතිය ලද දිනට පසුව එවැනි ප්‍රතිශෝධනයක් සඳහා කටයුතු කිරීමට ඉල්ලා සිටින පළමු අවස්ථාවේදි නිකුත් කර ඇති බදුකරයේ බදු ප්‍රතිශෝධන සඳහා වන කොන්දේසි සංශෝධනය කිරිමට කටයුතු කළ යුතුය.

04. තවද, අදාල අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අනුව මුල් බදු කාලය අවසන් වීමෙන් පසු නැවත බදු කාලය දීර්ඝ කිරීමේදි සියලු ප්‍රතිශෝධන සහිතව මුල් වසර තිහ (30) අවසානයේදී අයකළ බදු මුදලට 20% ක ප්‍රමාණයක් එකතු කොට ලබා ගන්නා අගය දෙවන බදු කාලයේ ආරම්භක බදු මුදල ලෙස ගණනය කිරිමට තීරණය කර ඇත්තේ වසර තිහක කාලයක් සඳහා බදු දී ඇති ඉඩම් සඳහා පමණි.

05. එසේ නමුත් මේ වන විට වසර තිහකට වඩා වැඩි වන බදු කාලය සඳහා නිකුත් කරන ලද බදුකර ද ක්‍රියාත්මක වන බැවින් එවැනි බදුකරයක කාලය දීර්ඝ කිරිමේදි උක්ත අංක 04 යටතේ දක්වා ඇති ක්‍රමවේදය අදාල කිරීමට කටයුතු කළ යුතුය. එහිදි මුල් බදු කාලය අවසන් වීමෙන් අනතුරුව නැවත ප්‍රධාන තක්සේරුකරු වෙතින් ඉඩමේ තක්සේරුව ඉඩම් නියෝග 217.3 අදාල කරගනිමින් ලබා ගැනිමට කටයුතු කළ යුතු අතර එම තක්සේරු වටිනාකම රු.5,000,000 (රුපියල් මිලියන පහ) ට වඩා අඩුවන අවස්ථා වලදි අය කරනු ලබන වාර්ෂික බදු අනුපාතය 2% ක් විය යුතුය.යම් අවස්ථාවක දී එම තක්සේරුව ඉහත වටිනාකම අභිබවා යන්නේ නම් වාර්ෂික බදු අනුපාතය 4% ක් විය යුතුය. අනෙකුත් බදු සහන උක්ත දැක්වෙන අනුපාතයන්ට අදාලව ඒ අයුරින්ම අදාල කර ගත යුතුය.

ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්,

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3. ලේකම්, මුදල් අමාත්‍යාංශ
4. ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
5. ලේකම්,මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

} ඔබගේ කාරුණික දැනගැනීම සඳහා

6. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
7. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

} කාරුණික දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා